# අභයගිරි (සංස්කෘත) ශිලා ලේඛනය තුළින් ප්‍රකට වන තත්කාලීන භික්ෂු සමාජය

පූජ්‍ය එච්. ඤාණවිසුද්ධි හිමි

සංස්කෘත අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
gnanavisuddhihp829@gmail.com

**මුඛ්‍ය පද -** අභයගිරිය, සංස්කෘත ශිලා ලේඛන, සංඝ සමාජය, ආරාම පාලනය, විනය

**හැඳින්වීම**

ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී උපයෝගී කර ගනු ලබන ප්‍රධාන මූලාශ්‍රයකි, පුරාවිද්‍යා මූලාශ්‍රය. එහිලා විවිධ අභිලේඛන, කාසි, නටබුන්, චිත්‍ර හා මූර්ති ආදි විවිධ පුරාකෘති තත් මූලාශ්‍රයට ඇතුළත් වේ. අභයගිරි (සංස්කෘත) ශිලා ලේඛනය වනාහි අනුරාධපුර කුට්ටම් පොකුණ අසල තිබී හමු වූ ක්‍රි.ව. 09 වන ශත වර්ෂයට අයත් නාගරී අක්ෂරයෙන් රචිත වැදගත් පුරාවිද්‍යා මූලාශ්‍රයකි. මෙහි අන්තර්ගත වන්නේ අභයගිරි විහාර සංකීර්ණයේ ඇති විහාරයක සතර මහා නිකායෙන් භික්ෂූන් 25 බැගින් වැඩම කරවා වාසය කරවීමත්, උන්වහන්සේලා විසින් සහ සේවයේ නියුතු නිලධාරීන් විසින් පිළිපැදිය යුතු නීතිරීති සහ වත් සිරිත් ආදියත්, සේවකයන් සඳහා ලබා දෙන වැටුප් හා දීමනා ආදියත් සම්බන්ධවයි. මෙම පර්යේෂණයේ අරමුණ අභයගිරි ශිලා ලේඛනයෙහි සඳහන් තොරතුරු ආශ්‍රයෙන් තත්කාලීන සංඝ සමාජයේ ස්වභාවය පිළිබඳ විමසීම වන අතර පර්යේෂණ ගැටලුව (Research Problem) ලෙස තත්කාලීන සංඝ සමාජය කෙබඳු වූවක් ද? යන්න සලකා පර්යේෂණය සිදු කරන ලදී.

**ක්‍රමවේදය**

මෙය ගුණාත්මක (Qualitative) පර්යේෂණයකි. එමගින් දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය සිදු කෙරේ. එහි දී ප්‍රධාන වශයෙන් ප්‍රස්තුතයට අදාළ දත්ත වියුක්ත ව ගෙන විශ්ලේෂණය කොට අධ්‍යයනය කරනු ලබයි. එය වඩාත් අදාළ වන්නේ ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි ය. ඊට ආධාරක ලෙස ද්විතීයික මූලාශ්‍රය ද උපයෝගී කරගනු ලබයි. ඒ අනුව මෙම පර්යේෂණයේ දී පුරාවිද්‍යා මූලාශ්‍රය හා ඒ ආශ්‍රයෙන් ම විරචිත සාහිත්‍ය මූලාශ්‍රය ප්‍රධාන කොටගත් ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි ද ඊට ආධාරක ලෙස ද්විතීයික මූලාශ්‍රය කෙරෙහි ද සාවධාන විය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

ලක්දිව තුළ ප්‍රකාශිත ශිලා ලේඛන අතර සංස්කෘත භාෂාවෙන් රචිත ශිලා ලේඛන ලෙස දැනට සොයා ගෙන ඇත්තේ ශිලා ලේඛන තුනකි. ඒ අතර අභයගිරි ශිලා ලේඛනය වනාහි ඓතිහාසික තොරතුරු රාශියක් ම වාර්තා කරන ශිලා ලේඛනයක් ලෙස අතිශය වැදගත් ය. මෙය විශේෂ වශයෙන් සංඝ සමාජයේ හා විහාරාරාම ආශ්‍රය කරගත් පරිපාලන කටයුතු ආදිය සම්බන්ධ අධ්‍යයනවල දී ප්‍රමුඛ අධ්‍යයන මූලාශ්‍රයකි. මෙම පර්යේෂණයේ දී මූලික වශයෙන් අවධානය යොමු වූයේ අභයගිරි ශිලා ලේඛනයේ සඳහන් විහාර පරිශ්‍රයෙහි 'වාසය නොකළ යුතු යැයි' ඉතා දීර්ඝ වශයෙන් විවිධ කරුණු ඔස්සේ දක්වා ඇති භික්ෂූන් පිළිබඳ අධ්‍යයනය කර තදනුගත ව සංඝ සමාජයේ තත්කාලීන ස්වරූපය පිළිබඳ නිරීක්ෂණය කිරීමයි. ඒ අනුව මෙම පර්යේෂණයේ දී රැස් කළ දත්ත විශ්ලේෂණය මගින් ප්‍රතිඵල කිහිපයකට එළැඹීමට හැකි විය. එම ප්‍රතිඵල පහත පරිදි වේ.

- විවිධ බලපෑම් නිසා සංඝ සමාජය තුළ පරිහානීය ලක්ෂණ හට ගෙන ඇත.

අභයගිරි ශිලා ලේඛනයේ **'න වස්තව්‍යම්'** (නොවිසිය යුතුයි) යන ශීර්ෂයෙන් දක්වා ඇති තත් විහාරයන්හි වාසය නොකළ යුතු භික්ෂූන් වහන්සේලා පිළිබඳ දක්වා ඇති කරුණු අධ්‍යයනය තුළින් සංඝ සමාජයේ තත්කාලීන ස්වභාවය පිළිබඳ යම් නිගමනයකට එළැඹීම අපහසු නොවේ. යම් නීතියක් හෝ ආඥාවක් පනවනු ලබන්නේ ඊට අදාළ යම් සාවද්‍ය ක්‍රියාවක් හෝ සිදුවීමක් සිදු වූ හෝ සිදු වන කල්හි ය. එසේ නොමැති ව අහේතුක ලෙස නීතිරීති පැනවීමක් සිදු නොවේ. විනය පිටකයට අනුව, බුදුරදුන් ද පාරාජිකාදි විනය නීති පනවා ඇත්තේ යමෙක් යම් වරදක් සිදු කළ කල්හි ආදිකම්මිකයා ද නිදහස් කරමිනි. ඒ අනුව මෙම පර්යේෂණයට

අදාළ කරගත් උපන්‍යාසය නම්, *'න වස්තව්‍යම්'* ආදි වශයෙන් තත් විහාරයන්හි යම් පිරිසකට නොවසන ලෙස දක්වා ඇති නිසා එවැනි පිරිස් එකල ශාසනය තුළ වාසය කොට ඇත යන්න යි. එලෙස මිත්‍යාජීවීන්, *(මිත්‍යාජීවිනා)* ස්ත්‍රී පෝෂකයින්, *(ස්ත්‍රී පෝෂකෙනා)* සාහසිකයන්, *(කිම් ශස්ත්‍රධර තපස්විභිඃ)* ආදි වශයෙන් විස්සක් පමණ වූ පිරිසක් සඳහන් කොට ඔවුන්ට එම විහාරයන්හි ආහාරපාන සහ වාසස්ථාන *(ග්‍රාසවාස)* තහනම් කොට තිබේ. තත්කාලීන ව මෙසේ අවිනයවාදී ව අධර්මවාදී ව කටයුතු කළ ඇතැම් භික්ෂූන් වාසය කොට ඇති බව මෙම සාධක තුළින් පැහැදිලි වේ.

- තත්කාලීන සංඝ සමාජයේ නිකාය භේදයක් විද්‍යමාන විය.

ශිලා ලේඛනයේ පැහැදිලි ව දක්වා ඇති කරුණක් නම් එකල නිකාය සතරක් තිබූ බවයි. *(චතුර්මහානිකායෙෂු)* නමුත් ඒවායෙහි නම් දක්වා නැත. කෙසේ වෙතත් අභයගිරි විහාර පරිශ්‍රයේ ඉදි කර ඇති මෙම විහාරයෙහි නිකාය සතරෙන් භික්ෂූන් 25 බැගින් 100 නමක් නිකාය භේදයකින් තොර ව වාසය කළ යුතු බව දක්වා තිබේ. මහා විහාර, අභයගිරි, ජේතවන හා සාගලික ලෙස ඓතිහාසික මූලාශ්‍රයන්හි තත් නිකාය හතර දක්වා ඇත.

- එම නිකාය භේදය දුරු කොට සංඝ සාමග්‍රිය ඇති කිරීම පිණිස රජු ප්‍රධාන ථේරවාදී භික්ෂූන් මැදිහත් වී ඇත.

වළගම්බා ආදි මුල්කාලීන රජවරුන්ගේ කාලයේ සිට ම ලක්දිව තුළ නිකාය භේදයක් ඇති ව තිබූ බව ඓතිහාසික මූලාශ්‍රයවල පවා දක්වා තිබේ. ඒ අනුව මෙම ශිලා ලේඛනය රචනා කළ කාලයේ නිකාය සතරක් තිබූ බව ඉහත දැක්විණි. නිකාය භේදය දුරු කොට සංඝ සාමග්‍රිය ඇති ව වාසය කළ යුතු බව මෙම ශිලා ලේඛනයේ ද සඳහන් කොට තිබේ. මෙහි කර්තෘ පිළිබඳ නිශ්චිත නැතත් කිසියම් රජෙකුගේ මූලිකත්වයෙන් පිහිටුවන්නට ඇති බව සිතිය හැකි ය. එය එසේ නම් රජුගේ දායකත්වය ද මේ සඳහා ලැබී තිබේ. *'නිකායභේදම් විනාපි....'*, *'යෙෂු නිකායෙෂ්වසංප්‍රණීතා තපස්විනඃ තදන්‍යනිකායෙස් තදාශ්‍රයෙණ ස්ථාතව්‍යම්'* ආදි වශයෙන් ශිලා ලේඛනයේ එම කරුණ සඳහන් වේ.

- ලක්දිව තුළ මහායාන බලපෑමක් හෝ එයට නතු වීමක් ඇතැම් නෛකායික භික්ෂූන් අතර විය.

මෙම ශිලා ලේඛනය රචිත සමය ලෙස සලකන ක්‍රි.ව. 09 ශත වර්ෂය වන විට ලක්දිව තුළ ථේරවාදයට අමතර ව මහායානයට අයත් මතවාද හා අදහස් ද පැතිර ඇති බව ඓතිහාසික මූලාශ්‍රයන් මගින් පැහැදිලි වේ. ඒ සමඟ ම බ්‍රාහ්මණ ධර්මය ද ලක්දිව තුළ යම්තාක් දුරට පැතිර පවතින්නට ඇත. මහාවිහාර භික්ෂූන් වහන්සේලා පාලි භාෂාව මුල්කර ගෙන ධර්ම ශාස්ත්‍රීය සම්ප්‍රදාය රැක ගනිමින් කටයුතු කළ අතර අභයගිරි හා ජේතවන නිකායන් වෙනත් ශාස්ත්‍රයන්ට මූලික ස්ථානය දෙමින් ක්‍රියා කොට ඇත. මහායාන නිකායෙහි සන්නිවේදන මාධ්‍ය වූයේ *සංස්කෘත* භාෂාව යි. ලක්දිව තුළ මහායානයේ බලපෑම පැහැදිලි ව හඳුනාගත හැකි කරුණක් නම් අභයගිරි ශිලා ලේඛනය ද සංස්කෘත භාෂාවෙන් රචනා වී තිබීමයි. එසේ ම සෙල්ලිපියේ සඳහන් *'පඤ්චිකාස්ථවිර'* (අයවැය සටහන් කරන භික්ෂුව) ආදි ඇතැම් තනතුරු ද මහා විහාරීය සම්ප්‍රදායට එකඟ නොවේ.

ක්‍රි.ව. 9 වැනි ශත වර්ෂයේ භික්ෂු සමාජය පිළිබඳ සිදු කළ මෙම අධ්‍යයනයේ දී ප්‍රස්තුත ශිලා ලේඛනාගත තොරතුරු අනුව එකල සංඝ සමාජය තුළ යම් පරිහානියක් දක්නට ලැබෙන බව පැහැදිලි කරුණකි. ඒ අනුව ශිලා ලේඛනයේ ඇතුළත් ඒ ඒ විහාරයන්හි වාසය නොකළ යුතු භික්ෂූන් පිළිබඳ දක්වා ඇති විස්තරයෙන් එය තහවුරු වේ. මෙකී කරුණු අනුව තත්කාලීන සමස්ත සංඝ සමාජය ම නොවුවත් ඇතැම් නිකාය හෝ යම් යම් විහාර ආශ්‍රිත ව සංඝ සමාජයේ පරිහානීය ලක්ෂණ විද්‍යමාන බව නිගමනය කළ හැකි ය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

Wickremasinghe, D.M. de Z. ed., (1912) ***Epigraphia Zeylanica***. London: Oxford University Press.

අමරවංශ නාහිමි, කොත්මලේ (1969) ***ලක්දිව සෙල්ලිපි,*** පළමු සංස්ග කොළඹ සී/ස ඇම්.ඩී ගුණසේන සහ සමාගම.

සුරවීර, ඒ.වී. (2005) ***කතිකාවත් හා භික්ෂු සමාජය.*** (තෙවැනි සංස්.) බත්තරමුල්ල: සමීර ප්‍රකාශන.